## කොළඹ විශ්වවිද්‍යාලය - ශ්‍රී ලංකාව

### අධ්‍යාපන පීඨය

### පශ්චාත් උපාධි අධ්‍යාපන ඩිප්ලෝමා (පූර්ණ කාලීන)
### පළමු සෙමෙස්තර අවසාන පරීක්ෂණය - 2016

### CU 503 - තුලනාත්මක අධ්‍යාපනය

**පැය තුනයි (03)**

**පළමුවන කොටසේ සියලුම ප්‍රශ්නවලටද දෙවන කොටසින් ප්‍රශ්න හතරකටද (04) පිළිතුරු සපයන්න.**

---

## I – කොටස

1. පැරණි දේශීය අධ්‍යාපනයේ ලංකාවේ පැවති ද්විතික අධ්‍යාපන අවස්ථාව තුළ ක්‍රියාත්මක වූ වෘත්තීය අධ්‍යාපන අවස්ථා දෙක දක්වන්න.

(ලකුණු 5)

2. පැරණි දේශීය අධ්‍යාපනය තුළ විද්‍යාමානවන අධ්‍යාපන මූලධර්ම තුනක් (03) ලියා දක්වන්න.

(ලකුණු 5)

3. ලන්දේසි යුගයේ ලංකාවේ ක්‍රියාත්මක කළ පාසල් හතරක් (04) දක්වන්න.

(ලකුණු 5)

4. තරුණ අසහනයට විසඳුම් මාර්ග ඉදිරිපත් කළ හැකි යැයි හඳුනාගෙන ඇති මට්ටම් තුනක් හඳුන්වන්න.

(ලකුණු 5)

5. විවිධ කාල වකවානුවල සංවර්ධනය මැනීම සඳහා යොදාගත් දර්ශන පහක් නම් කරන්න.

(ලකුණු 5)

6. මහාබ්‍රිතාන්‍යයෙහි 1944 දී ස්ථාපිත වූ ත්‍රිත්ව පාසල් ක්‍රමය දක්වන්න.

(ලකුණු 5)

7. චීන අධ්‍යාපන පද්ධතියේ දැක්ම සඵලකරගැනීම සඳහා ඉදිරිපත් වූ යෝජනා තුනක් දක්වන්න.

(ලකුණු 5)

8. ඇමරිකා එක්සත් ජනපදය බහු සංස්කෘතික අධ්‍යාපනය ලබාදීම සඳහා යොදාගන්නා ලද ප්‍රධාන ප්‍රයත්නයන් තුන නම් කරන්න.

(ලකුණු 5)

## II - කොටස

9. ලංකාවේ පැරණි දේශීය අධ්‍යාපනය තුළ ක්‍රියාත්මක වූ වැදගත් අංග හෝ මූලධර්ම පහක් වර්තමාන අධ්‍යාපනයට හා සමාජයට ගලපාගත හැකි ආකාරය විස්තර කරන්න.

(ලකුණු 15)

10. ආචාර්ය සී.ඩබ්.ඩබ්. කන්නන්ගර මැතිතුමාගේ අධ්‍යාපන ප්‍රතිසංස්කරණ වැදගත් වන ආකාරය පැහැදිලි කරන්න.

(ලකුණු 15)

11. "ශ්‍රී ලංකාවේ ක්‍රියාත්මක වූ 1972 අධ්‍යාපන ප්‍රතිසංස්කරණ නව අධ්‍යාපන ප්‍රවනතා හා ප්‍රතිපත්ති රැසක් හඳුන්වා දෙන ලද්දකි." මෙම කියමන විමර්ශනය කරන්න.

(ලකුණු 15)

12. I. සමකාලීන සමාජ ප්‍රශ්නයක් ලෙස තරුණ අසහනය හඳුනාගෙන අධ්‍යාපනය හා සම්බන්ධ සාධක එයට පසුබිම් විය හැකි ආකාරය පෙන්වා දෙන්න.

(ලකුණු 07)

II. ස්ත්‍රී පුරුෂ බව ආශ්‍රිත ගැටලුවලට පසුබිම් වී ඇති සාධක හඳුන්වා පුමිතිරි බව අනුව අධ්‍යාපන ක්‍රියාවලියේදී සිදුවන විෂමතා පරීක්ෂා කරන්න.

(ලකුණු 08)

13. I. අධ්‍යාපනය ආර්ථික ප්‍රාග්ධනයක් ලෙස ලෝකයේ තහවුරු වූ ආකාරය පැහැදිලි කරන්න. (ලකුණු 07)

II. අධ්‍යාපනයේ ආර්ථික වටිනාකම තක්සේරුකරන ක්‍රම සංසන්දනාත්මකව විස්තර කරන්න.

(ලකුණු 08)

14. I. ඇමෙරිකානු අධ්‍යාපන පද්ධතිය තුළ දැකිය හැකි සුවිශේෂ ලක්ෂණ පැහැදිලි කරන්න. (ලකුණු 07)

II. "ඇමරිකානු අධ්‍යාපනය ශිෂ්‍ය කේන්ද්‍රීය අධ්‍යාපන ක්‍රමයකි" මෙම නියමන පැහැදිලි කරන්න.

(ලකුණු 08)

15. I. "බ්‍රිතාන්‍ය අධ්‍යාපනය ප්‍රභූ අධ්‍යාපනය සඳහා සැකසුණු පද්ධතියකි." මෙම ප්‍රකාශනයෙහි වලංගුතාව පැහැදිලි කරන්න. (ලකුණු 07)

II. ශ්‍රී ලංකාවේ අ.පො.ස. (උ.පෙළ) විභාගය බ්‍රිතාන්‍යයේ උසස් පෙළ විභාගය සමග තුලනාත්මකව සසඳා එමගින් දෙරටේ සිසුන්ට ඇතිවන වාසි අවාසි විවරණය කරන්න.

(ලකුණු 08)

16. විවිධ ජනවර්ගවලට අයත් මිනිසුන් වෙසෙන රටක් ලෙස ඔවුනොවුන් අතර සාමය හා සහජීවනය ඇතිකිරීම සඳහා ශ්‍රී ලංකාවේ පාසල් අධ්‍යාපනය දායක වී ඇති ආකාරය නිදසුන් සහිතව විමර්ශනය කරන්න.

(ලකුණු 15)

O∘O∘O∘O∘O∘O∘O∘O∘